ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/01/පොදු-covid19/2020 | ඔබේ අංකය / உமது இல / Your Ref. | දිනය / திகதி / Date 2021.08.16 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,

සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/පිරිස්/මුදල්/ඉංජිනේරු සේවා/සැලසුම්),

ලේකම්, (ප්‍රධාන/අධ්‍යාපන/කෘෂිකර්ම/ධීවර/ක්‍රීඩා) අමාත්‍යාංශය,

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්.

දකුණු පළාත.

**<u>රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම.</u>**

රටේ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ කාර්යාල කටයුතු බාධාවකින් තොරව පවත්වා ගැනීම සඳහාත් මහජන සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහාත් පහත විධිවිධාන පරිදි කටයුතු කරන ලෙස කාරුණික ව දන්වා සිටිමි.

1. මහජන සංචරණය සීමා කිරීම සඳහා සේවාලාභීන් හා නිලධාරීන් අතර පහත ක්‍රමවේද ඔස්සේ සේවා සැපයීමට ක්‍රියා කළ යුතු අතර මේ සෑම අවස්ථාවකදීම සේවාලාභීන් හා සම්බන්ධ විය හැකි දුරකථන අංකයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

    I. ක්ෂණික දුරකථන අංක ( Hotline Numbers)
    II. විද්‍යුත් තැපැල (e-mail)
    III. ෆැක්ස් (fax)
    IV. කාර්යාලීය වෙබ් අඩවිය හෝ වෙනත් මාර්ගගත ක්‍රමවේද
    V. බාහිරින් ගෙන එන ලිපි ආයතන දොරටුවේදී ලබා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක්

2. එහිදී ඔබ විසින් භාවිතා කරනු ලබන සන්නිවේදන ක්‍රමවේද මහජනතාවට දැනගැනීමට කාර්යාල ප්‍රවේශයේ හා කාර්යාලයේ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කළ යුතුය.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office 091 4119010, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

3. සේවාලාභීන්ගෙන් ලබා ගන්නා සේවා ඉල්ලීම් පිළිබඳව සම්බන්ධීකරණ කටයුතු කිරීමට ආයතනය හෝ අංශයක් සඳහා නිලධාරීන් එක් අයෙකු හෝ දෙදෙනෙකු නම් කළ යුතුය.

4. ඉහත පරිදි ලැබෙන සේවාලාභී ඉල්ලීම් කාර්යාලයට ලද බවට අනිවාර්යෙන් හා ඉතා කඩිනමින් සේවාලාභියාට දැන්විය යුතු අතර, අනතුරුව එම ඉල්ලීම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඒ පිළිබඳව ඉතා කඩිනමින් සේවාලාභීන්ට දුරකථනයෙන් හෝ පහසු ක්‍රමයක් මඟින් අනිවාර්යෙන් දැනුම් දිය යුතුය.

02. ඒ අනුව, රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වා ගනිමින් මෙම දුෂ්කර කාල පරිච්ඡේදයේදී වුවද සේවාලාභීන්ට සේවා සැපයීම අඛණ්ඩව සිදු කිරීම සඳහා මෙම උපදෙස් සුදුසු පරිදි කළමනාකරණය කර කටයුතු කරන ලෙසත්, මේ සම්බන්ධයෙන් ඔබගේ යටත් ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

03. මෙම ලිපිය නිකුත් කරනු ලබන්නේ ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය මත බව වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්.සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත : සහකාර විගණකාධිපති, දකුණු පළාත. - දැ.ගැ.ස.